# සී/ස ලංකා නැව් සංස්ථාව
# (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය )

## ඇබෑර්තුව

පහත සඳහන් තනතුර පිරවීම සඳහා අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය දරන සුදුසු ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තොරතුරු තාක්ෂණ සහකාර තනතුර - MA 2-1, GR. III (ඇබෑර්තු

**<u>අධ්‍යාපන සුදුසුකම්</u> :**

**බාහිර අපේක්ෂකයින් :** වෘත්තීය : පරිගණක දෘඩාංග, පරිගණක ජාල, විදුලි හා ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයන් හී තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) වැනි මට්ටම ට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින්:** ඉහත බාහිර අපේක්ෂකයින්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

හෝ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද පරිගණක දෘඩාංග, පරිගණක ජාල, විදුලි හා ඉලෙක්ට්‍රොනික යන ක්ෂේත්‍රවල ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (4) මට්ටම ට නොඅඩු ප්‍රවීණතා සහතිකය ලබාගෙන වසර 03 ක සේවා පළපුරුද්දක් තිබීම.

**වැටුප් පරිමාණය :** MA 2-1 – 2016 : රු. ( 30,310-10×300-07×350-4×495-20×660-50,940) සංශෝධිත වැටුපට අනුව, 2024/01/01 දිනට MA 2-1 කාණ්ඩයේ III ශ්‍රේණියේ මූලික වැටුප රු. 30, 310/- ක් වේ.

ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත අනෙකුත් අදාළ දීමනා ගෙවනු ලැබේ.

**<u>සියලුම තනතුරු සඳහා පොදු කොන්දේසි</u>**

**වයස් සීමාව:** වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පරිවාස කාලය** : බාහිර අයදුම්කරුවන් සඳහා වසර 03 ක් වන අතර අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වසරකි.

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ. / සේ.නි.භා.අරමුදලට සංස්ථාවේ දායකත්වය
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම් සඳහා රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගල සහ අනතුරු රක්ෂණ ආවරණය
4. භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු වලට ගෙවීම්
5. වාර්ෂික ප්‍රසාද දීමනා අදාළ පරිදි
6. සහනශීලී නියමයන් මත නිවාස ණය සහ සේවක මණ්ඩල ණය
7. සහනශීලී නියමයන් මත වාහන ණය

## පොදු උපදෙස්

- සියලුම අයදුම්පත් තමාවිසින් සත්‍ය බවට සහතික කළ අධ්‍යාපන / වෘත්තීය සහතිකපත්වල පිටපත් සමඟ උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව **ලියාපදිංචි තැපෑලෙන් දැන්වීම පළ වූ දින සිට දින 14ක් හෝ ඊට පෙර සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව, අංක 27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් මාවත), කොළඹ 01** වෙත ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පතෙහි සහ එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.

- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.

- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

---

**සභාපති**

**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**

**අංක 27,MICH ගොඩනැගිල්ල**
**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)**
**කොළඹ 01**

**වැඩි විස්තර සඳහා (+94) 011 2 497 800, 258/251 දුරකථන දිගුව, මානව සම්පත් අංශය**

**දිනය: 19.04.2024**